GMOA
ESTABLISHED IN 1926
TU No. 291
THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION
No.275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07

Tel : 2580886 / 0714 999555
Fax : 4518668 / 2503586
Web : www.gmoa.lk
Email : info@gmoa.lk
office@gmoa.lk

2014/09/03

## මාධ්‍ය නිවේදනයයි

### දරුවන් ඉලක්ක කරගත් අහිතකර ආහාර ප්‍රවර්ධනය සඳහා වෙළඳ දැන්වීම් මගින් කරනු ලබන බලපෑම

බෝ නොවන රෝග ලංකාවේ ප්‍රධානම දීර්ඝ කාලීන ප්‍රශ්නය බවට පත් වී ඇත. ලෝක සෞඛ්‍ය සංවිධානය පෙන්වා දෙන පරිදි දරුවන්ගේ ස්ථූලභාවය හේතුවෙන් මතු පරපුර, විශාල වශයෙන් බෝ නොවන රෝග වලට ගොදුරු වීමේ අවධානම ඉතා ඉහල ගොස් ඇත. මේ අනුව දරුවන්ගෙන් 3% ක් අධි බර හා ස්ථූලභාවයට පත්වීම නිසා අනාගතයේ දරුවන් සෞඛ්‍ය හා අධ්‍යාපනික ගැටළු රාශියකට මුහුණ දෙනු ඇත.

සෞඛ්‍යට හිතකර ආහාර (Healthy Foods) පරිභෝජනය සඳහා දරුවන් යොමු කිරීම ජාතික අවශ්‍යතාවක් මෙන්ම ඉතාම කාලීන සහ හදිසි අවශ්‍යතාවයකි. එවන් යුගයක අහිතකර ආහාර (Unhealthy Foods) ප්‍රවර්ධනය සඳහා සමාජයේ විශේෂ ජනප්‍රිය චරිත අලලා විවිධ වෙළඳ ප්‍රචාරණ සිදු වෙමින් පැවතීම ඉතා කණගාටුවට කරුණකි.

එවන් පසුබිමක අප දරුවන්ගේ වටිනාකම තේරුම් ගනිමින් ඉතාමත් විශිෂ්ඨ කලාකාරිනියක් වූ ජැක්ලින් ෆර්ඩිනැන්ඩස් සහ විශිෂ්ඨ ක්‍රීඩකයෙකු වූ අරජුන රණතුංග මුදල් වෙනුවෙන් නුසුදුසු දැන්වීම් වලට ඉදිරිපත් නොවීම අප බෙහෙවින් අගය කරමු. වෛද්‍ය සංගම්වල විශේෂඥ වෛද්‍යවරුන්ගේ ඉල්ලීම් පවා නොතකමින් ශරීරයට අහිතකර ආහාර ප්‍රචාරයන්ට ඉදිරිපත් වන ජනප්‍රිය චරිත වලට මෙම ආදර්ශය පිළිපදිනා ලෙස අපි ඉල්ලා සිටිමු.

ස්තූතියි,

වෛද්‍ය ලසන්ත පිනදාස
ලේකම්

වැඩිදුර විස්තර සඳහා : වෛද්‍ය හරිත අළුත්ගේ - 0718121619
වෛද්‍ය සමන්ත ආනන්ද - 0777666301